# කොටි යුද්ධයට සැරසෙද්දී ආණ්ඩුව සාමයට සූදානම්

කොටි සංවිධානය මීට වසර 3 කුත් මාස 3 කට පෙර අත්සන් තබන ලද සටන් විරාමය 6000 වතාවකටත් වඩා කඩ කොට තිබේ. ආරක්ෂක අංශ පාර්ශ්වයෙන් එය කඩ වී ඇතැයි කොටි චෝදනා කර ඇත්තේ ද අවස්ථා කීපයක දී පමණි.
සටන් විරාමයේ තරම තේරුම් ගැනීමට මෙම තත්වය හොඳට ම ප්‍රමාණවත් ය. සටන් විරාමය තුළ දී කොටි ශක්තිමත් වූහ. අලුතින් ආයුද තොග ගණන් ගෙන ආහ. ආයුද නැව් 20 කට වැඩි සංඛ්‍යාවක් සටන් විරාමය කාලය තුළ දී කොටි ශ්‍රී ලංකාව තුළට රැගෙනවිත් ඇතැයි ආරක්ෂක බුද්ධි අංශ සඳහන් කරයි. මෙම කාල සීමාව තුළ දී ලෝකයට බණ දෙසමින් කොටි ළමයින් ඇතුළු දහසකට අධික තරුණ තරුණියන් පිරිසක් තම සංවිධානයට බඳවාගෙන තිබේ. එහි දී වැඩි පිරිසක් බඳවාගෙන ඇත්තේ බලහත්කාරයෙන් වීම විශේෂත්වයකි. මේ හැරෙන්නට සටන් විරාම සමය තුළ දී කොටි මරා දැමූ ආරක්ෂක බුද්ධි අංශවලට සම්බන්ධ පිරිස 100 කට අධික ය. ආරක්ෂක අංශ සාමාජිකයන් 40 කට ආසන්න පිරිසක් ඝාතනය ලක් වූහ. කොටින්ගේ මේ අපූරු සටන් විරාමයේ අලුත්ම බිල්ල ගනු ලැබුවේ මැයි මස 31 වන අඟහරුවාදා ය.
මැයි මස 31 වන අඟහරුවාදා කොටි සටන් විරාම කාල සීමාව තුළ දී ඝාතනය ලක් වූ ජ්‍යෙෂ්ඨතම හමුදා නිලධාරියා යන තේමාව යටතේ යුද හමුදා පළමුවන සන්නද්ධ බුද්ධි බලකායේ අණ දෙන නිලධාරී මේජර් තුවාන් නිෂාම් මුතාලිෆ් වෙඩි තබා මරා දැමූහ. මේජර් මුතාලිෆ් යනු ශ්‍රී ලංකා යුද හමුදාව සතුව සිටි අති දක්ෂ බුද්ධි නිලධාරියෙකි. සිංහල දෙමළ ඉංග්‍රීසි යන භාෂා තුනෙහි ප්‍රවීනයෙකු වූ ඔහු විවිධ තරාතිරමේ පිරිස් ඇසුරු කරමින් කොටි සංවිධානයේ රහස් රැසක් හෙළිදරව් කළ තැනැත්තෙක් විය. සුප්‍රසිද්ධ මිලේනියම් සිටි දිගු දුර මෙහෙයුම් බලකායට අවශ්‍ය මෙහෙයුම් සඳහා පදනම් වූ සියලු බුද්ධි තොරතුරු ලබා දුන්නේ මේජර් මුතාලිෆ් විසිනි. එමෙන් ම කරුණා කොටි සංවිධානයෙන් වෙන් කිරීම සඳහා වැදගත් වැඩ කොටසක් ඉටු කළ පුද්ගලයෙකු ලෙස ද ඔහු ප්‍රකට ය. එම කරුණු ම මේජර් මුතාලිෆ් කොතරම් දක්ෂ බුද්ධි නිලධාරියෙක් දැයි යන්න තහවුරු කරයි. එම නිසා ම සෙසු බුද්ධි අංශ නිලධාරීන් රැසකට ආරක්ෂාව ලබා දීමට කටයුතු සකස් ව නොතිබිය දීත් මේජර් මුතාලිෆ් වෙනුවෙන් විශේෂ ආරක්ෂාවක් ලබා දී තිබිණ.
එහෙත් එදින මේජර් මුතාලිෆ් ගමන් කළේ විශේෂ ආරක්ෂක විධිවිධානවලින් තොරව ය. එසේ ගියේ ඇයි ද යන්නට විවිධ අය විවිධ පිළිතුරු දෙති. එහෙත්, ඒ සම්බන්ධ නිවැරදි ම පිළිතුර දන්නේ මේජර් මුතාලිෆ් ම පමණි. කෙසේ හෝ අවසානයේ සිදු වූයේ කොටි තුවක්කුකරුවෝ ඔහු ඝාතනය කිරීම ය. මේජර් මුතාලිෆ්ගේ නොසැලකිල්ල ද මේ ඝාතනය සඳහා ඉවහල් වී තිබේ. ඔහු සුපුරුදු ආරක්ෂක පියවර අනුගමනය කළා නම් මින් ගැලවෙන්නට බොහෝ දුරට ඉඩ තිබිණ. අනෙක් අතට මතුව ඇති ප්‍රශ්නය වන්-න් ඝාතනයට ලක් වූ දින මේජර් මුතාලිෆ් ආරක්ෂාවක් නොමැතිව ගමන් කරන බව කොටි දැනගත්තේ කෙසේ ද යන්න ය. එක්කෝ මේජර් මුතාලිෆ් සමඟ ගනුදෙනු කරන පුද්ගලයෙකු කොටින්ට මෙම තොරතුරු දුන්නා විය හැකි ය. එසේ නොමැති නම් මුතාලිෆ්ගේ නිවස පෙනෙන මානයේ ඔහු ඝාතනය කිරීමේ අරමුණින් ම කොටි විශේෂ සොයා බැලුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගියා විය හැකි ය. කෙසේ වෙතත් මෙම ලිපිය ලියන දිනය වන විට මුතාලිෆ් ඝාතනයට සතියක් කිට්ටු වෙමින් තිබිය ද ඝාතකයන් පිළිබඳව යමක් කිරීමට ආරක්ෂක අංශවලට නොහැකි වී තිබේ. එය රටේ ආරක්ෂක තත්වය පිළිබඳ භයානක පෙරවදනක් බව ද නොලියා බැරි ය.
මේජර් මුතාලිෆ් ඝාතනය කළේ කොළඹ ස්ථානගතව සිටින කොටි සාමාජිකයන් පිරිසක් බව මෙම ලියුම්කරුගේ ආරංචිමාර්ග සනාථ කළේ ය. වාර්තා වන අන්දමට ආරක්ෂක අංශ කොළඹ හා ඒ ආශ්‍රිතව කොටි ස්ථානගත වී සිටින ස්ථාන 10 ක් පමණ හඳුනාගෙන ඇත. එහෙත් ඔවුන් ඒවා වටලන්නට යන්නේ නැත. ඊට හේතුව වී ඇත්තේ සටන් විරාමයයි. සටන් විරාමය රැක ගන්න ඕනෑ යයි කියමින් ආණ්ඩුව ආරක්ෂක අංශවලට එවැනි වැටලීම්වලට ඉඩ දෙන්නේ නැත. මේ නිසා කොටින්ට හිතේ හැටියට කොළඹ හැසිරෙන්නට අවස්ථාව ලැබී තිබේ. මෙම තත්වය වෙනස් නොවුණහොත් ඉදිරියේ දී කොළඹ හා ඒ ආශ්‍රිතව තවත් ඝාතන සිදුවුව ද එහි විශේෂ අරුමයක් නොවන්නේ ය.
ත්‍රිකුණාමලය අපේ මව් බිමේ මර්මස්ථානයකි. කොටින්ට අනුව එය ඔවුන්ගේ සිහින ඊළාම් රාජ්‍යයේ අග නගරයයි. කෙසේ වෙතත් මේ දිනවල ත්‍රිකුණාමලයේ පවතින්නේ බෙහෙවින් භයානක වාතාවරණයකි. එය හට ගත්තේ ඉතා සුළු සිදුවීමක් පදනම් කරගෙන ය. ත්‍රිකුණාමල නගරයේ සිංහල ත්‍රිරෝද රථ රියදුරන්ගේ රථ ගාලේ කෙළවර කුඩා බුදු පිළිමයක් ස්ථාපනය කර තිබිණ. පසුගිය වෙසක් පොහොය දිනයේ මෙම කුඩා බුදු පිළිමය වෙනුවට විශාල බුදු පිළිමයක් ස්ථාපනය කිරීමට ත්‍රිරෝද රථ රියදුරන් ඇතුළු බෞද්ධයෝ පියවර ගත්හ. මෙය කොටින්ට හොඳ ඉල්ලමක් විය. දෙමළ ජනතා සංවිධානය නම් බෝඩ් ලෑල්ලක් ඉස්සරහට දමා ගත් කොටියෝ බුදු පිළිම විරෝධයක් මතු කරමින් හර්තාල් ඇරඹූහ. කොටින් දිගින් දිගටම කීවේ බුදු පිළිමය ඉවත් කරන ලෙස ය. මෙහි දී පැවැත් වුණු හර්තාලයක දී කොටි එල්ල කළ බෝම්බ ප්‍රහාරයකින් සිංහල තරුණයෙකු ද මිය ගියේ ය. අන්තිමේ දී ප්‍රශ්නය විසඳා ගන්නට අධිකරණයේ පිහිට පැතීමට සිදු විය. මෙහි දී අධිකරණ තීන්දුව වූයේ බුදු පිළිමය පමණක් නොව ත්‍රිකුණාමලයේ පවතින හින්දු කෝවිල් දහයකට අධික සංඛ්‍යාවක් ඇතුළු සියලු ම අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතු බව ය. එහෙත් කොටි කියන්නේ ඒවාට ඉඩ දිය නොහැකි බව ය. ඔවුන් කියන්නේ බුදු පිළිමය ඉවත් කළ යුතු බවම ය. කොටින්ගේ මෙම අදහස දෙමළ ජනතාවගේ අදහස ලෙස තේරුම් ගැනීම වැරදි ය. බහුතර දෙමළ ජනතාවක් කොටින්ගේ මෙම අදහස් පිළිගන්නේ නැත. එහෙත් තුවක්කුව බෝම්බය හරහා එල්ල වන මරණ බිය නිසා සාමාන්‍ය දෙමළ ජනතාවට ද කොටින්ගේ පදයට නැටීමට සිදුව තිබේ. මේ ලිපිය ලියන විට කොටි බුදු පිළිමය ඉවත් කරන ලෙස ඉල්ලා උතුර නැගෙනහිර පුරා ම දැවැන්ත හර්තාල් ව්‍යාපාරයක් අරඹා තිබේ. ඇතැම් තැන්වල මෙය ඉතා ප්‍රචණ්ඩව ක්‍රියාත්මක වේ. මෙය කොතැනින් කෙළවර වේද යන්න ද කිව නොහැකි තරමට එය ප්‍රචණ්ඩ ය.
කොටින්ගේ මෙම හැසිරීම සමහරු දකින්නේ ඔවුන් යළි යුද්ධයක් ඇරඹීමට සූදානම් වීමක් ලෙසිනි. එහි ඇති වැරැද්දක් ද නැත. මන්ද යත් තමන්ට තම අරමුණ දිනා ගැනීම සඳහා යුද්ධය හැර වෙනත් විකල්පයක් නැති බවට කොටි දැන් ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කරන්නට පටන් ගෙන ඇති නිසා ය. ළඟදී ම තමන් ජාත්‍යන්තර ප්‍රජාවට මේ බව දැනුම් දී යුද්ධ කරන බව කොටි නායකයෝ කීප දෙනෙක් ම ප්‍රකාශ කර තිබුණහ. මේ පදනම තුළ කොටි යළි යුද්ධයකට සැරසෙන බවට සාධාරණ සැකයක් මතු වෙයි. කෙසේ වෙතත් එයට මුහුණ දීමට ආණ්ඩුව සූදානම් ද යන්න මෙහි දී මතුවන ප්‍රශ්නයකි. ජනාධිපතිනිය කියන විදිහට දැන් ශ්‍රී ලංකාවට යළි යුද්ධ කළ නොහැකි ය. ඒ සඳහා මුදල් නැත. ඒ නිසා ඒකාබද්ධ යාන්ත්‍රණය හෝ වෙන මොනවා හෝ කොටි ඉල්ලන දෙයක් ලබා දී යුද්ධය වලක්වා ගත යුතු බව ඇගේ ප්‍රකාශවලින් ගම්‍යමාන වන අදහස ය. එහෙත් එසේ කටයුතු කළ හැකිදැයි යන්න ගැටළුවකි. රටක කොන්ද පිළිබඳ ප්‍රශ්නයකි. රටක නායිකාව හෝ නායකයා ඒ රටේ අභිමානය රැකිය යුතු ය. යුද්ධය කළා හෝ නොකළා හෝ එයට සූදානම් බවවත් තම රට යටත් කර ගැනීමට හෝ බෙදා වෙන්කර ගැනීමට කිසිවකුට ඉඩ නොතබන බවට වචනයෙන් හෝ පැවසිය යුතු ය.
කොටින්ට එරෙහි යුද්ධයක් ජයගත හැකිය යන්න හුදු සිහිනයක් නොවන බව ආරක්ෂක විශ්ලේෂකයෝ පෙන්වා දෙති. කොටි ලොව ප්‍රබලතම හා දරුණුතම ගරිල්ලා සංවිධානය බව සැබෑවකි. එහෙත්, කලකට පෙර ඔවුන්ගේ සන්නද්ධ නායකයා වූ කරුණා කොටින්ගෙන් වෙන් විය. ඇත්තට ම කියනවා නම් ඔහු දැන් ඉන්නේ නැගෙනහිර අල්ලා ගැනීමේ සූදානමිනි. ඔහු කියන්නේ ආණ්ඩුව තමාට උදව් කිරීම කෙසේ වෙතත් කොටින්ට උදව් නොකර පැත්තකට වී සිටිනවා නම් නැගෙනහිරින් කොටින් පලවා හැරීම සුළු දෙයක් බව ය. කරුණා යනු එල්ටීටීඊ සංවිධානයේ යුද්ධ යන්ත්‍රයේ මොළය ය. එය මෙහෙය වූවේත් පවත්වාගෙන ගියේත් කරුණා ප්‍රමුඛ නැගෙනහිර සටන්කරුවෝ ය. මාන්කුලම් ප්‍රහාරය, ජයසිකුරු ආපසු හැරවීම, අලිමංකඩ ප්‍රහාරය ආදී කොටින්ගේ ජයග්‍රහණයන් ලෙස සැලකෙන මෙහෙයුම්වල මූලිකත්වය ගත්තෝ කරුණා ඇතුළු නැගෙනහිර සටන්කරුවෝ ය. එවැනි පිරිසක් කොටින්ට එරෙහිව සටන් කිරීම යනු අන් කවරදාකවත් නොතිබූ තත්වයකි. මේ පසුබිම තුළ ආණ්ඩුවට කොටින්ට එරෙහිව යුද්ධයක් ජයග්‍රහණය කිරීමට අන් කවරදාකටවත් වැඩි ජයග්‍රාහී පසුබිමක් සකස් වී තිබේ. එම පසුබිමේ නිසි ඵල ලබා ගැනීම රටේ නායකයන්ගේ වගකීම ය. එහෙත්, ප්‍රශ්නය ඇත්තේ රටේ නායකයන් එවැන්නකට සූදානම් නොවීම ය. ඔවුන් හදන්නේ කෙසේ හෝ කොටි සමඟ සම්බන්ධකම් පවත්වාගෙන ගොස් ෂේප් න්‍යායෙන් ප්‍රශ්නය විසඳා ගැනීමට ය. කොටි සමඟ ෂේප් න්‍යායෙන් ප්‍රශ්නය විසඳා ගත නොහැකි බව ඉතිහාසය පුරා ඔප්පු වී තිබේ. එහෙත් අපේ රටේ නායකයන් මෙය තේරුම් නොගන්නා තාක්කල් මෙම ප්‍රශ්නයට ද ස්ථිර විසඳුමක් නොලැබෙනු ඇත.

**මේජර් මුතාලිෆ් ඝාතනය කළේ කොළඹ ස්ථානගතව සිටින කොටි සාමාජිකයන් පිරිසක් බව මෙම ලියුම්කරුගේ ආරංචිමාර්ග සනාථ කළේ ය.**



**ආරක්ෂාව**